# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2384/27 - 2024 මැයි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2024.05.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ සහ 70ඇ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී.වී. 101137 දරන සහ ඉංගිරිය පාර, මීපේ, පාදුක්ක යන ස්ථානයේ පිහිටි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන, එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් එකී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබාගැනීමෙන් පසු, සහ එකී එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2024 මාර්තු මස 20 වැනි දින දරන සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සංස්ථාගත කිරීමේ සහතිකය යටතේ "ශ්‍රී ලංකා ටෙක්නොලොජි කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යනුවෙන් සංස්ථාගත කරන ලද බැවින්ද, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2016 දෙසැම්බර් මස 02 වැනි දින අංක 1995/39 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ "එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන වචන දැක්වෙන සෑම තැනකම ඒ වෙනුවට, "ශ්‍රී ලංකා ටෙක්නොලොජි කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන වචන ආදේශ කිරීමෙන් ඒ නියෝගය මෙයින් සංශෝධනය කරනු ලබන අතර ඉහත කී වගන්ති ප්‍රකාර මින් පෙර කරනු ලැබ ඇති යම් නියමයක, දැන්වීමක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" සම්බන්ධයෙන් ඇති සෑම සඳහනක්ම "ශ්‍රී ලංකා ටෙක්නොලොජි කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ්" සම්බන්ධයෙන් කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

තව ද, මේ නියෝගය ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දිනයට පෙරාතුව ම 2016 දෙසැම්බර් මස 02 වැනි දින අංක 1995/39 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් "එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත පැවරී ඇති යම් බලයක් ප්‍රකාරව, එකී එස්. එල්. ටී. කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ක්‍රියාත්මක කරන ලද යම් බලයක්, හෝ කරන ලද යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් සියලු කාර්යය සඳහා, ශ්‍රී ලංකා ටෙක්නොලොජි කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ක්‍රියාත්මක කරන ලද සේ සහ කරන ලද සේ සලකනු ලැබිය යුතු බවට ද මෙයින් නියම කරනු ලැබේ.

ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත,
අධ්‍යාපන අමාත්‍ය.

2024 මැයි මස 14 වැනි දින,
කොළඹ දී ය.

EOG 05 - 0122


1A - PG 6728 — 284 (2024/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*